**කොළඹ මහා නගර සභාව - 2023**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාචනය කළ මතය

කොළඹ මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොළඹ මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාචනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**(අ)** මහා නගර සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**(ආ)** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.6 ඡේදයේ 1.6.1(ii) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම *විගණන නිරීක්ෂණය* | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | වර්ෂය තුළ ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද ස්ථානගත වීමේ අත්තිකාරම් හා කොන්ත්‍රාත් සඳහා අතුරු ගෙවීම් වලින් සමන්විත රු.1,913,188,795ක් වූ කෙරීගෙන යන වැඩ ප්‍රමිතියට වූ මඟපෙන්වීම්වල EG 3.1 ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ උපලේඛනයේ වෙනම ප්‍රභේදයක් ලෙස පෙන්වීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ප්‍රමිතිය අනුව කෙරීගෙන යන වැඩ ගිණුමක් මඟින් කෙරීගන යන වැඩ සඳහා ගෙවීම් ගිණුම්ගත කළයුතු අතර ඉදිකිරීම් අවසන්කර අවසාන ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ස්ථාවර වත්කම් ගිණුමට මාරු කළ යුතුය. |
| **(ආ)** | ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ කොළඹ මහා නගර සභාවේ මලාපවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා රු.18,678,077,179ක මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විට ආයෝජනය කර තිබීම සම්බන්ධයෙන් ප්‍රමිතියේ 3.20 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම | ප්‍රමිතිය අනුව වත්කම් ගිණුම්ගත කිරීම හා නියමිත හෙළිදරව් කිරීම් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් දෙකක මුදල් පොත් අනුව එකතුව රු.704,942,158 ක් වුවත් 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශයේ දක්වා ඇති මුදල රු.725,056,999ක් වීමෙන් රු.20,271,585 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මහජන බැංකු ගිණුම් හා ශේෂ පොත් සසඳා නිවැරදි කරගැනීම් කළ යුතුය. |
| **(ආ)** | 2022 දෙසැම්බර් 31 දිනට පැවති විවිධ ණයහිමි ශේෂ තුළ ඇතුලත් ස්ථාවර වත්කම් මිලට ගැනීමේදි ඇතිව තිබූ ණයහිමියන් හා කොන්ත්‍රාත් ගෙවීම් මත ඇතිව තිබූ ණයහිමියන් එකතුව රු.940,454,269ක් සමාලෝචිත වර්ෂය තුල සමුච්චිත අරමුදලෙන් ලියා හැර තිබුණි. | එම | ණය හිමියන්ගේ ස්වභාවය හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයෙන් නව ගිනි නිවීමේ රථ 13 ක් ලැබීම හේතුවෙන් කොළඹ මහා නගර සභාව භාවිතා කරමින් පැවති එකතු වටිනාකම රු.123,105,831 ක් වූ ගිනි නිවීමේ රථ 15 ක් 2022 වර්ෂයේදී පළාත් පාලන ආයතනවලට පවරා දී තිබුණද ගිණුම්කරණ ගැලපීම් සිදු කිරීම 2023 වර්ෂයේදී සිදු කරන බව නාගරික කොමසාරිස් විසින් දන්වා තිබුණද එකතු වටිනාකම රු.85,993,586 ක් වූ ගිනි නිවීමේ රථ 8 කට අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | පවරා දී තිබුණු රථ 8 හි පිරිවැය හඳුනාගෙන එකී පිරිවැය පළාත් පාලන ආයතන වෙත පවරා නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්විය යුතුය. |
| **(ඈ)** | පුස්තකාල පොත් සඳහා ක්ෂය අනුපාතය සියයට 10 ක් ලෙස හෙළිදරව් කර තිබුණද පුස්තකාල පොත් ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ප්‍රවර්තන වර්ෂයේදී මිලදී ගත් රු.11,952,410 ක් වූ පොත් මිල දී ගැනීමේ පිරිවැය වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.**

| | **විෂයය** | **මුදල රු.** | **නොසැපයූ විගණන සාක්ෂි** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| **(අ)** | දේපල පිරියත හා උපකරණ ගිණුම්කරණ පද්ධතියේ ස්ථාවර වත්කම් මොඩියුලය | 22,427,931,916 | විස්තරාත්මක තොරතුරු | පිළිතුරු ලබාදී නොමැත. | ගිණුම්කරණ තොරතුරු පද්ධතියේ ස්ථාවර වත්කම් මොඩියුලයේ වත්කම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් කළ යුතුය. |
| **(ආ)** | ගෙවිය යුතු තැන්පතු ගිණුම් 29 | 3,677,669,861 | ලිපිලේඛන | එම | සත්‍යාපනය කිරීමට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| **(ඇ)** | කලින් ගෙවීම් | 16,566,011 | තහවුරු සාක්ෂි. | එම | තහවුරු සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| **(ඈ)** | අත්තිකාරම් මුදල | 2,910,316 | වැටුප් අත්තිකාරම් ලබාගත් නිළධාරින්ගේ හෝ සේවකයින්ගේ විස්තර ඇතුළත් තොරතුරු | එම | එම |
| **(ඉ)** | අතැති මුදල් හා චෙක්පත් | 9,288,091 | ශේෂ තහවුරු කිරීම්. | එම | විගණනයට ශේෂ තහවුරු ලිපි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| **i.** | VIII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | පොදු වෙළඳපලවල වෙළඳසැල් පරිපාලකවරුන් දෙදෙනාම රාජකාරියේ නියුතුව සිටින විට කිසිඳු පදනමකින් තොරව 2023 දෙසැම්බර් මාසයේ පමණක් රු.87,671 ක මුදලක් අනවශ්‍ය ලෙස අතිකාල සඳහා ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | පදනමකින් තොරව අතිකාල වැඩ ලබා නොදී වියදම් පාලනය කළ යුතුය. |
| **ii.** | XXII පරිච්ඡේදයේ 22.4 වගන්තිය | නාගරික ලේකම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත සේවකයින් 20 දෙනෙකු 2023 වර්ෂයේදී ලබා තිබුණු වැටුප් රහිත නිවාඩු පිළිබඳ වාර්තා විගණකාධිපතිට එවා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වැටුප් රහිත නිවාඩු පිළිබඳ තොරතුරු පොදු 96 ආකෘතිය අනුව විගණකාධිපතිවරයා වෙත වාර්තා කළ යුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මු.රෙ.570<br>මු.රෙ. 571 | දීර්ඝ කාලයක සිට නොවෙනස්ව පවතින එකතුව රු.229,964 ක්වූ තැන්පතු 9ක වටිනාකම නියාදනය කර නොතිබුණි. | එම | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | ජනාධිපති ලේකම්ගේ 1995 ජුලි 12 දිනැති අංක SEI/A/4/34 දරන චක්‍රලේඛය 9 වන වගන්තිය | පෞද්ගලික පාර්ශ්වයන්ට බදු දෙන ඉඩම් සම්බන්ධව ගිවිසුම් අලුත් කිරීම, හිඟ මුදල් එකතු නොවීමට වග බලා ගැනීම, ගිවිසුම් කොන්දේසි පිළිපැදීම අධීක්ෂණය කිරීම හා කොන්දේසි උල්ලංඝණය වී ඇති අවස්ථාවල දේපළ වල සන්තකය ආපසු පවරා ගැනීම ආදී කටයුතු සිදුකර නොතිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලිය රු.111,335,194 ක් විය. | එම | චක්‍රලේඛ උපදෙස් පරිදි බදු දේපළ පිළිබඳව කටයුතු කළ යුතුය. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| **i.** 1999.10. 8 දිනැති අංක 22/99 දරන හා 2016.03.09 දිනැති අංක 5/2016<br>2007.08.08 දිනැති අංක 19/2007<br>2007.10.23 දිනැති අංක 23/2007<br>2008.06.26 දිනැති අංක 14/2008<br>2016.09.07දිනැති අංක 05/2016(1) | නිල වාහන සඳහා හිමිකමක් නොමැති තනතුරක් වන නියෝජ්‍ය ප්‍රධාන ආයුර්වේද වෛද්‍ය නිළධාරී වෙත චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව 2023 අගෝස්තු සිට 2024 ජනවාරි දක්වා කාලපරිච්ඡේදයට රු.588,630 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛවලට පටහැනිව සිදුකර ඇති ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **ii.** 1999.10.08 දිනැති අංක 22/99 චක්‍රලේඛයේ 1 ඒ උප ඡේදය හා 2017.11.07 දිනැති අංක 22/99(XXXIII) චක්‍රලේඛය | කොළඹ මහා නගර සභාවේ විශේෂ කොමසාරිස්ගේ 2010 සැප්තැම්බර් 17 දිනැති අංක 1231 දරන තීරණය මඟින් නිල වාහන සඳහා හිමිකමක් නොමැති තනතුරු වල සේවයේ නියුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පළමු පන්තියේ නිළධාරීන් 27 දෙනෙකුට හා ගණකාධිකාරිණියකට නිල වාහන අනුයුක්ත කිරීමටත් රු.350 ක මුදලක් අයකර නගර සීමාව නොතකා පෞද්ගලික පාවිච්චිය සඳහා අවසර දීම සිදුකර තිබුණි. | එම | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.2,940,432,774 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.2,905,893,767 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** සභාව විසින් පවත්වාගෙන යන ජංගම ගිණුම් 03 කට අදාලව රු.60,252,835 ක් වූ සෘජු හෝ සාවද්‍ය බැර කිරීම් ද ජංගම ගිණුම් 5 කට අදාල රු.14,662,980ක් වූ සෘජු හෝ සාවද්‍ය හර කිරීම් ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සෘජු හෝ සාවද්‍ය හර කිරීම් සහ බැර කිරීම් හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** 2021,2022 වර්ෂවලට අදාල උපලබ්ධි නොවූ රු.1,320,517 ක් වූ තැන්පතු 50 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම | උපලබ්ධි නොවූ තැන්පතු වලට අදාලව මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ඇ) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ රු. 25,144,846ක් වටිනා චෙක්පත් 511 ක් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම | මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භ කර තිබූ බැංකු ගිණුමේ තැන්පත්ව තිබූ මුදලින් රු766,951,035 ක් නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර තිබූ අතර 2023 සැප්තැම්බර් 30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.134,950,233 ක් විය. | එම | නාගරික සංවර්ධන ගිණුමේ පවත්නා මුදල් සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන | 2023 බිල් කළ ආදායම රු.මිලියන | 2023 රැස්කළ ආදායම රු.මිලියන | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.මිලියන | 2022 ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන | 2022 බිල් කළ ආදායම රු.මිලියන | 2022 රැස්කළ ආදායම රු.මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|
| i. | වරිපනම් හා බදු | 7,366.5 | 5,430.3 | 5,565.7 | 4,492.1 | 5,160.5 | 4,358.4 | 4,166.2 | 4,368.2 |
| ii. | කුලී | 319.8 | 309.2 | 226.6 | 1,235.1 | 335.8 | 271.9 | 191.7 | 1,177.8 |
| iii. | බල පත්‍ර ගාස්තු | 126.3 | 162.2 | 98.6 | 4.5 | 221.9 | 89.9 | 67.6 | 1.8 |
| iv. | වෙනත් ආදායම් | 2,714.6 | 2,093.8 | 1,841.3 | 438.2 | 3,511.6 | 1,318.7 | 1,052.2 | 679.6 |
| | | 10,527.2 | 7,995.2 | 7,732.2 | 6,169.9 | 9,229.8 | 6,038.9 | 5,477.7 | 6,227.4 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| **i.** 2023 ජනවාරි 01 දිනට රු.4,316,776,152 ක් වූ හිඟ වරිපනම් හා බදු මුදලින් ප්‍රවර්තන වර්ෂයේදී රු.933,100,725 ක් එනම් සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල හිඟව තිබූ වරිපනම් බදු මුදලින් සියයට 22 ක් පමණක් අයකර ගෙන තිබුණි. වර්ෂය ආරම්භයේ පැවති හිඟ මුදලින් රු.933,100,725 ක් අයකළද සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුදල රු.1,353,476,656 ක් වීමෙන් වරිපනම් හිඟ මුදල වර්ධනය වෙමින් පවතී. ඒ අනුව හිඟ මුදල් අයකර ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. පෙර වර්ෂවල වරිපනම් බදු හිඟව පැවතියදී සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු මුදල ගෙවීමට අවසර ලබාදීමද හිඟ මුදල් වර්ධනය වීමට හේතු වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මහනගර සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **ii.** | බැංකු මඟින් වරිපනම් ගෙවීමේදී දේපල පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුලත් කර තිබේද යන්න මුදල් භාරගන්නා බැංකුවේ මුදල් අයකැමි විසින් පරීක්ෂා කර මුදල් භාර ගැනීම නිසි පරිදි කරවා ගැනීම සඳහා වරිපනම් බදු මුදල් භාරගනු ලබන බැංකු සමඟ ගිවිසුම්ගත එකඟතාවයකට මේ දක්වා පැමිණ නොතිබුණු හෙයින් 2023 දෙසැම්බර් 31 දිනට වරිපනම් මුදල් එකතු කිරීමේ අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.2,921,660 ක් වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වරිපනම් මුදල් භාර ගැනීම සම්බන්ධයෙන් බැංකු සමඟ ගිවිසුම්ගත එකඟතාවයකට පැමිණිය යුතුය. |
| **iii.** | සමාලෝචිත වර්ෂයේ රු.167,450,662 ක් වූ විනෝද බදු ආදායම පෙර වර්ෂයේ රු.128,147,498 ක් වූ විනෝද බදු ආදායම හා සැසඳීමේදී සියයට 30 ක වර්ධනයක් විය. 2023 වර්ෂයේ රු.80,000,000 ක් වූ අයවැයගත ආදායම සකස් කිරීමේදී සාධාරණව විනෝද බදු ආදායම ඇස්තමේන්තු නොකිරීමෙන් ආදායම් විචලනය සියයට 109 ට වඩා වැඩි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | තාත්ත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| **iv.** | 2022 දෙසැම්බර් 31 දිනට රු.51,428,430 ක් වූ හිඟ විනෝද බදු මුදල 2023 දෙසැම්බර් 31 වන විට රු.77,513,277 ක් දක්වා වැඩි වී තිබූ අතර වර්ෂය ආරම්භයේ පැවති හිඟයෙන් රු.11,256,465 ක් අයකර ගෙන තිබියදී හිඟ මුදල ඉහල යාමට බිල්කළ ආදායම එකතු කර ගැනීමේ දුර්වලතාවයද බලපා තිබුණි. | එම | හිඟ මුදල්ද, වර්ෂය තුල බිල් කරනු ලබන ආදායම වර්ෂය තුලදී එකතු කර ගැනීමටද අවශ්‍ය සියලු කටයුතු කළ යුතුය. |
| **v.** | කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ක්‍රියාත්මක මට්ටමේ පවතින සිනමාශාලා සඳහා අවස්ථා තුනකදී පනවන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ප්‍රදර්ශන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ රැගුම් ආඥා පනත යටතේ වාර්ෂිකව බලපත්‍ර ලබාගත යුතු වුවත් සිනමාශාලා 34 න් 10 ක් 2023 වර්ෂය සඳහා එම බලපත්‍රය ලබා නොගෙන දෛනික ප්‍රදර්ශන කටයුතු කළද 1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 6,12 හා 14 වගන්ති අනුව කටයුතු කර නොතිබුණි. | එම | පනත් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **vi.** | 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධන පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතින් ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා ගනු ලබන ඇතුලත්වීමේ ගාස්තුවෙන් අයකරනු ලබන බදු ප්‍රකාශනය හා කොන්දේසි ඉදිරි වර්ෂයන් සඳහා නැවත පැනවීමට එකී ආඥා පනතේ 2(1) උප වගන්තිය ප්‍රකාරව 2022 පෙබරවාරි 10 දින "අංක 1793 සභා තීරණයෙන් සම්මත කළ විනෝද බදු ප්‍රතිශත සඳහා බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යවා තිබුණද ඒ පිළිබඳ ඉදිරි කටයුතු නොකිරීම හේතුවෙන් අයකරන ලද විනෝද බදු මුදල නිත්‍යානුකූල නොවීය | එම | මහා නගර සභාව විසින් නිත්‍යානුකූලව විනෝද බදු අයකිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) කුලී**

| | | | |
|---|---|---|---|
| **i.** | 2023 වර්ෂයේ පොදු වෙළඳපොල කුලී හා මස් කඩ සඳහා ටෙන්ඩර් මුදල රු.114,518,769 ක් විය. කොළඹ මහා නගර සභාව සතු පොදු වෙළඳපොල 14 හි මස්කඩ හැර කඩ කාමර හා විවෘත වෙළඳකුටි 1314 ක් පැවතුනද ඉන් කඩ කාමර 1118 ක් බදු දීමට හැකිව තිබූ අතර 196 ක් නිශ්කාර්යව තිබුණි. බදුදී තිබූ කඩ කාමර වලින් 2023 වර්ෂය සඳහා අයකළ යුතු කුලිය රු.214,744,398 ක් වූ අතර අයකර ගෙන තිබූ කුලිය රු.50,000,294 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයට පමණක් හිඟ කුලිය රු.164,744,104 ක් විය. ඒ අනුව කුලිය අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 23 ක් වීමෙන් අය කිරීමේ දුර්වලතාවයක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | මහානගර සභාව සතු දේපල වලින් ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමට නිළධාරින් වගබලා ගත යුතුය. |
| **ii.** | නගර සභා නිල නිවාස 397 ක වසර 10 කට වැඩි කාලයක පෙර සිට විශ්‍රාමගත් සේවකයින් අනවසරයෙන් රැඳීසිටින අතර එකී නිවාස සඳහා රු.3 සිට රු.200 දක්වා වූ කුලී පරාසයක් තුල මාසික කුලියක් හිඟ කුලී ලෙස සළකා 2023 වර්ෂය සඳහා ගිණුම්ගත කළ මුදල රු.180,043 ක් විය. එහෙත් එම නිවාස නැවත පවරා ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | නිවාස නැවත පවරාගෙන ඉඩම නිදහස් කිරීම සඳහා වූ අධිකරණමය ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. |
| **iii.** | නගර සභාවට අයත් ව්‍යාපාරික ස්ථානවලින් කුලී මුදල් අයකර ගැනීම සහ කුලී නොගෙවන කඩ කාමර නැවත පවරා ගැනීමේ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ රු.98,495,941 ක් වූ හිඟ කුලිය 2023 දෙසැම්බර් 31 දින වන විට රු.103,116,196 ක් එනම් රු.4,620,255 කින් ඉහල ගොස් තිබීමෙන් කුලී අය කිරීමේ දුර්වල ප්‍රගතියක් තහවුරු විය. | එම | කුලී නොගෙවන ව්‍යාපාරික ස්ථාන සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීම කඩිනම් කළ යුතුය. |
| **iv.** | සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කළ පදික කඩ කුලී ආදායම රු.142,420,482 ක් වූ අතර රු.93,459,797 ක් පමණක් වර්ෂය තුල මුදලින් ලැබී තිබුණි. දිගින් දිගටම වර්ෂයේ නියමිත කුලිය නොලැබීම හේතුවෙන් හිඟ කුලිය රු.655,040,434 ක් විය. | එම | පුද්ගලයින් හඳුනානොගෙන ව්‍යාජ කුලී ගිණුම්ගත කිරීම වැළැක්වීමට පියවර ගත යුතුය. |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | | |
|---|---|---|---|
| **i.** | සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු ආදායම රු.53,269,000 ක් වූ අතර පෙර වර්ෂයේ රු.19,748,912 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායමට වඩා රු.33,520,088 ක එනම් සියයට එකසිය හැත්තෑවක (170%) වර්ධනයක් අත් කරගෙන තිබුණු නමුත් මහා නගර සභා ආඥා පනතේ 247(අ) වගන්තිය අනුව මේ පනතේ හෝ ආඥා පනත යටතේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවක් හෝ විස්තර කර ඇති කාර්ය සඳහා ස්ථානයක් පාවිච්චි කිරීමට බලපත්‍රයක් දිය යුතු වුවද අතුරු ව්‍යවස්ථා සම්මත කිරීමකින් තොරව නීතියට පටහැනිව බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකර තිබුණි. | එම | වෙනත් බලධාරි අධිකාරියක් යටතේ පාලනය නොවන සියලුම ව්‍යාපාර වර්ග සඳහා මහා නගර සභා අඥාපනතේ විධිවිධාන ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සම්මත කර බලපත්‍ර ලබාදීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **ii.** | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර බදු ආදායම රු.60,718,500ක් වූ අතර පෙර වර්ෂයේ රු.32,084,750ක් වූ ව්‍යාපාර බදු ආදායමට වඩා රු.28,633,750 කින් එනම් සියයට අසූනවයක (89%) ක වර්ධනයක් අත්කර ගෙන තිබුණද මහා නගර සභාව අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ඒ අනුව බලපත්‍ර ලබා දීමට කටයුතු නොකර ව්‍යාපාර බද්දක් අයකිරීම හේතුවෙන් මහා නගර සභාවේ පාලනයෙන් තොරව ව්‍යාපාර පවත්වාගෙන යාම හේතුවෙන් පාරිභෝගිකයින් වෙත ගුණාත්මක, සෞඛ්‍ය ආරක්ෂිත භාණ්ඩ හා සේවා නොසැපයීම හා අසාධාරණකම්වලට ලක්වීම මහජන හිරිහැරයක් ඇති වීම පරිසර දූෂණයක් ඇතිවීම, වාහන තදබදය වැනි ගැටළු මෙන්ම බලපත්‍රයක් රහිතව ව්‍යාපාර කටයුතු කිරීමද සිදු වී තිබුණි. | එම | මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවන් යටතේ බලපත්‍ර ලබා නොගන්නා ව්‍යාපාරවලින් බදු අයකර ගැනීම කළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| **i.** | 2023 වර්ෂය සඳහා දැන්වීම් පුවරු ප්‍රදර්ශන ආදායම රු.87,379,967 ක් වූ අතර පෙර වර්ෂයේ රු.42,699,478 ක ආදායමට සාපේක්ෂව සියයට 104 ක වැඩිවීමක් පෙන්නුම් කළද කොළඹ නගරයේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරුවලින් නිත්‍යානුකූලව අයකරගත හැකි ගාස්තු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් ආදායම අහිමි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කොළඹ නගරය තුල දැන්වීම් පුවරු විශාල සංඛ්‍යාවක් ප්‍රදර්ශනය කර තිබුණද නගර සභාවට සුළු ආදායමක් පමණක් ලැබෙන බැවින් අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **ii.** | බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් නිකුත් කර තිබූ 2011 ජුලි 05 දිනැති අංක 1713/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති කොළඹ මහා නගර සභාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මඟින් ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු නියම කර තිබූ අතර කොමසාරිස්වරයා විසින් 2017 වර්ෂයේ නියම කරන ලද ගාස්තුවක් අයකරමින් පැවතියද එම ගාස්තුව නීත්‍යානුකූල කර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම | මහානගර සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව නිත්‍යානුකූලව ප්‍රසිද්ධ කර අයකර ගැනීම කළ යුතුය. |
| **iii.** | සමාලෝචිත වර්ෂයේ වාණිජ හා කර්මාන්ත මලාපවහන සේවා සඳහා 2023 වර්ෂයේ අයවැයගත ආදායම රු.600,000,000 ක් වුවද එම ආදායම අයකර ගැනීම සඳහා වූ සභා සම්මත කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිවීමෙන් එවැනි ආදායමක් රැස්කර ගැනීමට නොහැකි වී තිබුණි. | එම | බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරවරයාගෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |
| **iv.** | සමාලෝචිත වර්ෂයේ රු.362,007,830 ක් වූ රථවාහන ගාල් කුලී ආදායම පෙර වර්ෂයේ රු.250,596,742 ක් වූ එම ආදායමට වඩා සියයට 44 ක වර්ධනයක් වුවද වර්ෂය ආරම්භයේ රු.525,292,069 ක් වූ හිඟ මුදලින් වර්ෂය තුලදී රු.91,313,378 ක් හිඟ ශේෂ කපාහැර තිබියදීත් 2023 දෙසැම්බර් 31 දින වන විට හිඟය රු.590,571,051 ක් දක්වා සියයට 12 කින් ඉහල යාමට රථවාහන ගාල් කොන්ත්‍රාත්කරුවන්ගෙන් කුලී මුදල් එකතු කර ගැනීමේ දුර්වල මට්ටම බලපා තිබුණි. | එම | කොළඹ මහා නගර සභාව වෙනුවෙන් අයකර ඇති ගාස්තුවක් වන හෙයින් රථ වාහන ගාල් කුලීය අප්‍රමාදව නගර සභාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ සාමාන්‍ය වැසි තත්ත්වයකදී පවා ජලයෙන් යටවන ස්ථාන 20 ක් පමණ සභාව විසින් හඳුනාගෙන තිබුණද වැසි ජලය පිටාර ගැලීම හේතුවෙන් ඇතිවන ගංවතුර තත්ත්වයන් අවම කර ගැනීම සඳහා නිම කිරීමට යෝජිත ව්‍යාපෘතිවල සමාලෝචිත වර්ෂය තුල භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට හා කොන්ත්‍රාත් පිරිනැමීමට අපොහොසත්ව තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වන බව. | හඳුනාගත් ස්ථාන සම්බන්ධව පිළියම් යෙදීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | ලෝක බැංකුවේ ණය ආධාර මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කොළඹ නගරය ආශ්‍රිත නොරිස් ඇල සංවර්ධන මඟින් ඊට එකතු වන වැසි ජලය සීග්‍රයෙන් බේරේ වැවට බැස යාම සඳහා මීටර් 632 කින් යුත් නව ඇළ මාර්ගයක් ඉදිකිරීමට ආරම්භ කළ නමුත් මහා නගර සභාවට අයත් නිවාස 36 කින් යුත් අබලන් නිවාස සංකීර්ණයක් හේතුවෙන් කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වී තිබූ අතර ඉතිරිව තිබූ මීටර් 105 ක් වූ ඇළ මාර්ගය නිම කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ රු.මිලියන 150 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණි. එම පදිංචිකරුවන් ඉවත් කිරීමට ගෙන තිබූ ක්‍රියාමාර්ග කඩිනම් නොවීම හේතුවෙන් මහා නගර සභාවට එකී මුදල උපයෝජනය කිරීමට නොහැකි වීමෙන් මරදාන ඩීන්ස් පාර වැසි ජලයෙන් යට වීම වළක්වා ගත නොහැකි වී තිබුණි. | පදිංචිකරුවන් ඉවත් කර ඉඩම පවරා ගැනීමේ කටයුතු වලදී පැනනගින ගැටළු නිරාකරණය කරගනිමින් පවතින අතර අධිකරණ නියෝග අනුව ක්‍රියාත්මක වීමේදී ජලසම්පාදන හා ජලාපවහන අංශයේ ප්‍රමාදයන්ද පවතින අතර අදාල නිළධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. |
| (ඇ) | ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් වසර කිහිපයකට පෙර සංසරාජ මාවතේ වැසි ජලය ගලායාම සඳහා කොන්ක්‍රීට් (24’’) නලයක් මීටර් 180 ක් පමණ වන තෙක් එලා තිබූ නමුත් අවසාන මීටර් 10 ක පමණ කොටස අවසන් කිරීමට හේතු වූ බාධාව ඉවත් කර තිබුණද ව්‍යාපෘතිය අවසන් කිරීමට කොළඹ මහා නගර සභාවේ වගකිව යුතු නිළධාරින් අසමත්ව තිබුණු බැවින් සුළු වැසි වලදී පවා එම මාවතට එකතු වන වැසි ජලය ගලා යාමට නොහැකි වීම හේතුවෙන් එම මාර්ගය ජලයෙන් යටවීම වළක්වා ගැනීමට නොහැකි වී තිබුණි . | 2024.01.19 වන දින ගැටළු සහගත තත්ත්වය නිරාකරණය වී ඇති බව. | වහාම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | i. කොළඹ නගරයේ පිහිටි පෞරාණික වටිනාකමක් සහිත ගොඩනැගිල්ලක් වූ නගරාධිපති නිල නිවාසය සඳහා මූ.රෙ 751(1) ප්‍රකාරව උපකරණ හා ගෘහ භාණ්ඩ සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2016 වර්ෂයේ සිට ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොමැති අතර භාණ්ඩ සමීක්ෂණයන්ද සිදුකර නොතිබුණි. එම අඩුපාඩු නිවැරදි කිරීමට පත්කල කමිටුව එම අඩුපාඩු නිවැරදි කරමින් පවතින බව. | ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන කර භාණ්ඩ සමීක්ෂණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| **ii.** 2018,2019,2020 යන වර්ෂ වලදී මිලදී ගත් එකතු වටිනාකම රු.560,250 ක් වූ උපකරණ හා ගෘහ භාණ්ඩ අස්ථානගත වී තිබීම සම්බන්ධයෙන් වූ අලාභයන් වගකිව යුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වගකිව යුතු පුද්ගලයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **iii.** නිල නිවාසය සඳහා ලබාගෙන තිබූ ජල සම්බන්ධතා 2 කට අදාල හිඟ මුදල රු.107,472 ක් හා ස්ථාවර දුරකථන සම්බන්ධතා 3 ක් හා අන්තර්ජාල සම්බන්ධතා සඳහා කාල පරිච්ඡේදයට හිඟ මුදල රු.49,289 ක් හිටපු නගරාධිපතිනියගෙන් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම | හිටපු නගරාධිපතිනිය පදිංචිව සිටි කාලයට අදාල බිල්පත් වල සඳහන් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** හිටපු නාගරික කොමසාරිස්වරිය විසින් අනුමැතියකින් තොරව පදවන ලද ජීප් රථයේ ගියර් පද්ධතියට හානිවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබූ අතර අලුත්වැඩියාව සිදුකළ ගරාජය විසින් අලුත්වැඩියාව නිම කර 2022 අගෝස්තු 15 දින රු.930,000 ක ඉන්වොයිසියක් ඉදිරිපත් කිරීමෙන් පසු මුදල් ගෙවා වාහනය ලබා ගැනීමට කටයුතු නොකර පුද්ගලික ගරාජයක තිබෙන්නට ඉඩහැර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් ගෙවා වාහනය නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතු අතර විධිමත් පරීක්ෂණයකින් අලාභයක් සිදුකර තිබේනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** 2017 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වූ එකතුව රු.6,031,795,723ක් වූ ණයහිමි වටිනාකමකින් ප්‍රවර්තන වර්ෂය තුළ මුළු ගෙවීම් රු.1,402,687,587ක් හෙවත් සියයට 23 ක් වී තිබූ අතර විවිධ ණයහිමියන් කළමනාකරණය දුර්වල මට්ටමක පැවතුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ණයහිමියන් ගිණුම්ගත කිරීම විධිමත් පාලන ක්‍රමයකට යටත්ව සිදුවිය යුතුය. |
| **(ආ)** වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබූ ඉතා දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු.17,057,736 ක ශේෂ 4ක් හා රු.817,585 ක හර ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම | කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කළ යුතු අතර හර ශේෂ නිරවුල් කළ යුතුය. |
| **(ඇ)** මුදල් හා මුදල් සමාන දෑ යටතේ වසර ගණනාවක් තිස්සේ පවත්නා එකතු වටිනාකම රු.3,934,868 ක ව්‍යාජ මුදල් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම | සත්‍ය වශයෙන් නොපවතින සියලු මුදල් පිළිබඳ සොයා බලා නිරවුල් කළ යුතුය. |
| **(ඈ)** කලින් ගෙවීම් සහ අත්තිකාරම් වටිනාකම තුල ඇතුලත් හඳුනා නොගත් ගිණුම් ශේෂ 10 ක එකතුව රු.5,426,492 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම | සත්‍ය වශයෙන් නොපවතින හඳුනා නොගත් අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඉ)** | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිකුත් කර තිබූ විගණන විමසුම් 24 ක් අතරින් විමසුම් 18 ක් සඳහා පිළිතුරු සපයා නොතිබූ අතර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේ ප්‍රමාදයද මාස 01 සිට මාස 10 ක් දක්වා විය. | එම | නියමිත දින වකවානු තුල විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | කොළඹ මහා නගර සභාවේ නාගරික සූනාගාරය තුලදී එළුවන් පමණක් ඝාතනය කෙරෙන අතර, ගවමස් වව්නියාව, හොරොව්පතාන, ගලෙන්බිඳුනුවැව, කහටගස්දිගිලිය, ගල්ගමුව, මධ්‍යම නුවරගම්පළාත, මිහින්තලේ, ගිරිබාව යන පළාත් පාලන බල ප්‍රදේශවල සිට කොළඹ සූනාගාරය දක්වා ප්‍රවාහනය කර කොළඹ නගරයේ ගවමස් කඩ වෙත බෙදාහරිනු ලැබේ. එසේ පළාත් පාලන බලප්‍රදේශවල සිට කොළඹ මහා නගර සභාවේ සූනාගාරය වෙත ගවමස් ප්‍රවාහනය කිරීම පවත්නා අතුරු ව්‍යවස්ථාවට සම්පූර්ණයෙන්ම පටහැනි වුවද දශක 4 ක කාලයක් තුල එලෙස ගවමස් ප්‍රවාහනය සිදුකළ ද ඊට අදාල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කර අනුමත කර ගැනීම හා ජාතික මට්ටමින් සිදුවිය යුතු නීති සම්පාදනය සඳහා අදාල බලධරයන්ගෙන් ඉල්ලීම් කිරීම ද සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හා ජාතික මට්ටමින් හා පළාත් සභා මට්ටමින් සිදුවිය යුතු නීති සම්පාදනයන් සඳහා වූ තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| **(ආ)** | ගවමස් පරීක්ෂා කිරීමේ ගාස්තුව මස් රාත්තලකට සත 05 ක් වූ අතර 1959 පෙබරවාරි 27 දිනෙන් පසුව ගාස්තු සංශෝධනය වී නොමැති බැවින් 2022 දෙසැම්බර් 27 දිනැති අංක 3516 දරන සභා තීරණය මගින් සම්මත කළ මස් පරීක්ෂාව සඳහා සේවා ගාස්තුව ගවයකු සඳහා රු.1500 ක්ද ඌරෙකු සඳහා 1500 ක්ද එළුවකු සඳහා රු.600 ක්ද වශයෙන් ප්‍රසිද්ධ කර අය නොකිරීම හේතුවෙන් රු.43,126,800 ක ආදායමක් අහිමි වී තිබුණි. | එම | සභා තීරණයට අනුව කටයුතු නොකිරීමට එරෙහිව හා ආදායම අහිමි කිරීමට එරෙහිව කටයුතු කළ යුතුයි. |
| **(ඇ)** | 1984 පෙබරවාරි 16 දින අතිගරු ජනාධිපතිතුමා හා ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් කෞතුකාගාරයක් හා සංස්කෘතික කලා හා වාණිජ මධ්‍යස්ථානයක් ලෙසට යලි පිහිටුවා "පැරණි නගරශාලා මධ්‍යස්ථානය" ලෙස නම්කර තිබුණු හා 16 2013 අගෝස්තු දිනැති අංක 1873/73 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් පැරණි ස්මාරකයක් ලෙස නම් කර ඇති කොළඹ 11 පිටකොටුව ප්‍රධාන වීදියේ පිහිටා ඇති පැරණි නගර ශාලා ගොඩනැගිල්ල හා පෞරාණික එඩ්මබරෝ ශාලාව එකී අරමුණු යටපත් වන පරිදි හා ගොඩනැගිල්ලේ පෞරාණිකත්වයට හා ප්‍රෞඪත්වයට හානිවන පරිදි ව්‍යාපාරිකයින්ට භාවිත කිරීමට ඉඩහැර තිබුණි. | අහිතකර තත්ත්වය විධිමත් කිරීමට පියවර ගනිමින් පවතින බව. | විදේශීය හා දේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් ස්ථානයක් බැවින් පෞරාණික ස්මාරක ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පැරණි නගර ශාලාවේ බදුදී ඇති කඩ කාමර සංඛ්‍යාව 48 ක් වු අතර මාසික කුලිය වසර පහෙන් පහට සංශෝධනය විය යුතු අතර ඒ අනුව නාගරික තක්සේරුකරු විසින් 2012 ජනවාරි 01 දින සිට අයකළ යුතු කුලිය 2012 ජුනි 29 දින තක්සේරු කර නියෝජ්‍ය භාණ්ඩාගාරික (ආදායම්) වෙත එවා තිබුණ නමුත් පරිගණක පද්ධතිය යාවත්කාලීන කර සංශෝධිත කුලිය අය නොකිරීම නිසා 2012 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු.27,958,260 ක් නගර සභා අරමුදලට අහිමිකර තිබුණි. | රු.27,958,260 ක අලාභයක් සිදුව තිබේද යන්න තවදුරටත් පරීක්ෂා කිරීමට කටයුතු කරන බව. | සිදුකර ඇති අලාභය වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකළ යුතුය. |
| (ඉ) | 2012 වර්ෂයේ තක්සේරු කඩ කුලිය නියමිත කාලය තුලදී අයකර ගැනීමට කටයුතු සිදු නොකර විෂය භාර නිළධාරීන් විසින් 2023 මැයි මාසයේදී එම තක්සේරු කුලිය අය කිරීමට කටයුතු කිරීම හේතුවෙන් 2017, 2022 වර්ෂවල සිදුකළ යුතුව තිබූ නව තක්සේරුව ද යටපත්ව අතීත කුලියක් අයකර ගැනීමෙන් 2023 වර්ෂයේ සිට අයකර ගත යුතු සාධාරණ කුලියද අහිමි කර තිබුණි. | අලාභයක් සිදුව තිබේද යන්න තවදුරටත් පරීක්ෂා කිරීමට කටයුතු කරන බව. | නොසැල්ලකිල්ල සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | 2022 වර්ෂයට අදාලව පොදු වෙළඳපොළවල කුලි සංශෝධනය සඳහා තක්සේරුව 2023 ජනවාරි 30 දින ලැබෙන විටදී කුලී සංශෝධනය කළ යුතු දින ඉක්මවා වසරක් ගතවී තිබුණද නව තක්සේරු කුලිය අනුව කුලී අය නොකිරීමත්, පරිගණක පද්ධතිය යාවත්කාලීන නොකිරීමත් හේතුවෙන් රු.7,862,400 ක් සභා අරමුදලට අහිමි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (උ) | බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්වරයා විසින් ප්‍රධාන ලේකම් ඇමතු අංක GOS/LES/2020 හා 2020 ජුලි 08 දිනැති ලිපිය මඟින් යොමුකර ඇති ආණ්ඩුකාරවරයාගේ නියමයන් අනුව හා පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/13/2016(1) හා 2020 දෙසැම්බර් 03 දිනැති චක්‍රලේඛය අනුව ගිවිසගත් දිනෙන් සෑම වසර 3 කටම වරක් වෙළඳපොල කඩ කාමරවල බදුකුලිය රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය කළ යුතුය.එහෙත් කොළඹ මහා නගර සභාවට අයත් වෙළඳපොල කඩ කාමරවල බදුකුලිය වසර 5කට වරක් වරින්වර සංශෝධනය කර තිබුණද එකවර වැඩි කඩකාමර ප්‍රමාණයක බදු කුලිය අවසන් වරට සංශෝධනය කර තිබුණේ 2017 වර්ෂයේ දී ය. | එම | ආණ්ඩුකාරවරයාගේ නියමයන් හා පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ උපදෙස් කෙරෙහි අවධානය යොමු කල යුතු අතර නියමිත කාල සීමාව තුල බදුකුලී සංශෝධනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2017 වර්ෂයේදී පොදු වෙළඳපොළ කුලී මුදල් සංශෝධනය කිරීමට අදාල මූල්‍ය කළමනාකරණ කමිටු තීරණය අනුව නාගරික තක්සේරුකරු විසින් බොරැල්ල පොදු වෙළඳපොලෙහි කඩකාමර සඳහා ඉදිරිපත් කර තිබූ සංශෝධිත කුලිය විශාල පරාසයක් තුල වෙනස් වී තිබුණු අතර සමහර කඩකාරමවල බදුකුලිය සියයට 33 කින් පමණ අඩු වීමටත් එම වෙළඳපලෙහිම තවත් කඩ කාමරයක කුලිය සියයට 824 ක් වැනි ඉහල ප්‍රතිශතයකින් ඉහලයාමටත් පදනම විගණනයේදී තහවුරු නොවීය. ඒ අනුව අපක්ෂපාතී සාධාරණ කුලී තක්සේරුවක් නාගරික තක්සේරුකරු විසින් සිදුකර නොමැති බවත් නාගරික තක්සේරුකරුගේ කඩකුලී තක්සේරුවට ප්‍රතිචාරීව වෙළඳ ප්‍රජාවගේ වරින්වර ඉල්ලීම් මත යෝජිත කුලියෙන් සියයට 20 ක් අඩු කිරීමට විශේෂ කොමසාරිස් තීරණය කර තිබුණි. ඒ අනුව වසර 10 ක් හා වසර 17ක කාල | එම | සාධාරණ කුලී තක්සේරුවක් කළ යුතු අතර තක්සේරු කරන ලද කුලිය සම්බන්ධව විරෝධතාවක් පවතින විට නැවත තක්සේරු කිරීමත් මිස නීතියට පටහැනිව ක්‍රියා නොකිරිමට වගබලා ගත යුතුය. |

| | | |
|---|---|---|
| පරාසයකින් පසුව සිදුකළ කඩකුලී වැඩි කිරීමෙන් පසුව කඩකාමර 26ක කුලිය 2016 වර්ෂයේ කුලියටත් වඩා අඩුවී තිබීම පිළිබඳව සභාව අවධානය යොමුකර නොතිබුණි. | | |
| **(එ)** කිරුළපන වෙළඳපොලෙහි දෛනික වෙළඳාම් කරන වෙළඳුන්ගෙන් දිනකට රු.50 ක කුලි මුදලක් අයකර බක්කි 68 ක් පොදු උපදෙස් මාලාවක් යටතේ පැවරීම සිදුකර තිබුණි. එම උපදෙස් හා කොන්දේසි අංක 05 අනුව පිළියෙල කළ ආහාර වර්ග වෙළඳාම තහනම් කර තිබියදී අංක 29 A ස්ථානයේ ඇලුමිනියම් හා වීදුරු යොදා ස්ථිර කඩ කාමරයක් සකස් කොට ආපන ශාලාවක් පවත්වාගෙන යන බවත් රු.55 ක කුලියක් පමණක් ගෙවමින් පොදු විදුලිය හා පොදු ජලය භාවිතා කරමින් ශිතකරණ, විදුලි පංකා, නෙස්කැෆේ යන්ත්‍ර, විදුලි කේතල හා රේඩියෝ යන්ත්‍රයක් භාවිතා කරමින් පැවතියද ව්‍යාපාරික ස්ථානයේ සන්තකය පවරා ගැනීමට හා විදුලිය හා ජලය අවභාවිතාවට අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම | ව්‍යාපාරික ස්ථානයේ සන්තකය පවරා ගැනීමට හා විදුලිය හා ජලය අවභාවිතාවට අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **(ඒ)** බොරැල්ල පොදු වෙළඳපොල බිම් මහල රථවාහන ගාලක් සහිත කඩ කාමර 369 කින් සමන්විත සිව් මහල් ගොඩනැගිල්ලෙහි කඩ කාමර 171 ක් බදු දීමට නොහැකිව වසා තිබීම හේතුවෙන් නගර සභාවේ ආදායම අහිමි වී තිබිය දී 2022 ජනවාරි 19 දින පලකරන ලද ටෙන්ඩර් දැන්වීමකට අනුව ව්‍යාපාරිකයකු විසින් අංක 7/2/2G, 7/2/2H, 7/2/25,7/2/2M දරන කඩ කාමර සඳහා රු.2,071,000 ක ටෙන්ඩර් මුදලක් ඉදිරිපත් කර තිබුණු අතර 2023 අප්‍රේල් 30 දින මහා සභාවේ අනුමැතිය ලැබුණු පසු රු.3,002,392 ක මුදලක් අයකර ගෙන තිබුණද 2024 මැයි 30 දිනය වන විටත් කඩ කාමර භාරදීමට කටයුතු කර නොතිබුණි. | එම | පොදු වෙළඳපල හැකි ආකාරයකට අලුත්වැඩියා කර ටෙන්ඩර් මඟින් වසා ඇති කඩ කාමර බදුදීමට කටයුතු කළ යුතුය. |
| **(ඔ)** 1987 අංක 38 දරන සමාජශාලා වලට බලපත්‍රදීමේ පනතේ 7 වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වගන්තිය අනුව සමාජශාලාව විසින් එකී කටයුතු පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලැබීමට අදහස් කරනු ලබන ස්ථානයක පැවතිය යුතු කරුණු 11 ක් ඉදිරිපත් කර තිබූ අතර එකී කරුණු සමඟ අනුකූල වන්නේ නම් මිස බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අවසර දිය යුතු අතර එම පනතේ(2) 2 වගන්තිය අනුව පනත ක්‍රියාත්මක වන දිනට පසු පිහිටුවනු ලැබූ යම් සමාජශාලාවක් සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කර තිබේ නම් මිස හෝ පාර්ලිමේන්තු පනත් මඟින් සංස්ථාගත කරනු ලැබ තිබේ නම් මිස සමාජශාලා බලපත්‍රය දීම හෝ අළුත් කිරීම නොකළ යුතුය. එහෙත් එම කරුණු පිළිබඳව සලකා බැලීමකින් තොරව සමාජශාලා 25ක් සඳහා බලපත්‍ර ලබාදී තිබුණි. | එම | සමාජශාලා වලට බලපත්‍රදීමේ පනතේ සඳහන් විධිවිධාන අනුව බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඕ)** | කොළඹ මහා නගර සභාවට අයත් ආර්.ඒ.ද මෙල් මාවතේ පිහිටි රූඩ් 02 පර්චස් 39 ක ඉඩම ආගමික කටයුතු වෙනුවෙන් යොදා ගැනීම සඳහා බදු ගිවිසුමක් මඟින් තක්සේරුගත බදු වටිනාකමක් අයකර ගැනීමකින් තොරව වසරකට රු.1200 බැඟින් වූ බදුකුලියක් යටතේ 1983 සැප්තැම්බර් 14 දින සිට වසර 99 ක් සඳහා බදුදී තිබුණි. එකී බදු ගිවිසුමේ 02 කොන්දේසිය උල්ලංඝණය කරමින් එම හිමියන් විසින් ඉඩමේ කොටස් උප බදු දී තිබුණු අතර අංක 3772 දරන අවලංගු කිරීමේ ගිවිසුම මඟින් නගර සභාවට නැවත පවරා ගන්නා ලද අංක 11 – 2009 දරන පිඹුරේ සඳහන් කර ඇති ලොට් අංක 1,2,3 කොටස් වල පිහිටි ගොඩනැගිලි නගර සභාව යටතට නොගෙන නගර සභා දේපළ තවදුරටත් අවභාවිතා වීමට ඉඩහැර තිබුණි. මෙලෙස වංචනික ලෙස ව්‍යාපාරික කටයුතු සඳහා යොදවා ගැනීමට ආධාර අනුබල දෙමින් කරුණු වසන්කර ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, වරිපනම් අංක ලබාදීම ආදි කටයුතු සිදුකළ නිළධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා බවට තීරණ ගෙන තිබුණද එවැනි විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර වර්තමානය දක්වාම නිළධාරින්ගේ සහය ඇතිව නගර සභාවට අයත් දේපල අවභාවිතා වෙමින් තිබුණි. තවද කුලී මුදල් කොළඹ මහා නගර සභාවට ගෙවීමට ජනාධිපති කාර්යාලය එකඟතාව පළකර තිබියදී එකී මුදල නගර සභාවට ලබා ගැනීමට ඉදිරි කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ඉඩමේ හා ගොඩනැගිල්ලේ අයිතිය නගර සභාවට පැවරී ඇති බැවින් වහාම භුක්තිය ලබාගෙන නැවත කුලියට දීම හෝ නගර සභාවේ කාර්යයන් සඳහා භාවිතා කිරීම සිදුකළ යුතුය. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ගෙවීමට එකඟ වී ඇති මුදල් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| **(ක) (i)** | පරණ යෝන්වීදියේ අංක 319 හා 323 දරන පර්චස් 38.32 ක් විශාල වූ ඉඩම පුද්ගලයෙකුට බදු ගිවිසුමක් මඟින් 1983 දෙසැම්බර් 09 දින සිට අවුරුදු 99 ක දීර්ඝ කාලීන බද්දකට ලබා දී තිබියදී අංක 964 දරන ගිවිසුම මඟින් බදු අයිතිය 1983 දෙසැම්බර් 09 දින සිට අවුරුදු 99 ක කාලපරිච්ඡේදයකට ව්‍යාපාරික ස්ථානයකට පවරාදී තිබුණි. බදුකරු ගෙවිය යුතු බිම්කුලිය ගෙවා නොතිබූ හෙයින් එකී කුලිය අයකර ගැනීමේ අරමුණින් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා බේරුම්කරණ ක්‍රියාවලියක්ද අධිකරණ ක්‍රියාවලියක්ද අනුගමනය කර තිබූ අතර 2007 නොවැම්බර් 21 දිනැති මහාධිකරණ තීරණය අනුව වූ රිට් ආඥාවද ක්‍රියාත්මක කර නොතිබුණි. ඉදිරි වසර 10 තුල සම්පූර්ණ හිඟ මුදල ගෙවා දැමීමේ එකඟතාවයෙන් මහාධිකරණයේ ගොනු කර තිබූ අංක HCARB1571/2003 නඩුව අවසන් කර තිබුණද 2019 අගෝස්තු 31 දින වන විට ගෙවා අවසන් කළ යුතු රු.20,823,102 ක සම්පූර්ණ හිඟ මුදල 2024 ජුනි 30 දින වන විටත් ගෙවා නොතිබුණු බදුකරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම | ව්‍යාපාරික ස්ථානය පවරාගෙන හිඟ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| **(ii)** | තවද බදුකරු වෙත මෙම ඉඩම බදුදෙන අවස්ථාවේ පැවති උත්සව ශාලාව වෙනුවට එම ප්‍රමාණයේම උත්සව ශාලාවක් සිව්වන මහලේ ඉදිකර දෙන බවට ගිවිසුම්ගතව තිබුණද එකී කොන්දේසි නොසලකා ගොඩනැගිලි සැලසුම අනුමත කිරීම | එම | නාගරික ජනතාවගේ අයිතිවාසිකම් පවා අහිමිකර ඇති මෙම ව්‍යාපාරික ස්ථානය නැවත පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

මගින් නගර සභා දේපල අවභාවිතා කිරීමට නගර සභා නිළධාරින් දිගින් දිගටම ඉඩදී තිබුණි.

| | | |
|---|---|---|
| **(ඛ) i.** කොළඹ 08 ඇල්විටිගල මාවතේ අංක 02 බී ස්ථානයේ පර්චස් 20ක් වූ ඉඩම අවමංගල්‍යා ශාලාවක් පවත්වාගෙන යාම සඳහා 1987 අගෝස්තු 10 දිනටත් දී තිබූ වසර 30ක බදු කාලය 2017 අවසන් වීමෙන් පසුව වසර 02කට එම බදුකරුටම බදු කුලී පදනම මත රු.725,000ක මාසික කුලියට ලබා දී තිබුණි. එකී කාලයද 2019 අගෝස්තු 11 දින අවසන්ව තිබූ අතර 2024 මැයි 30 දක්වා ගිවිසුමකින් තොරව කුලී ගෙවමින් දේපල පරිහරණය කිරීමට ඉඩහැර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ගිවිසුම්ගත කාලසීමාව අවසන්වීමත් සමඟ දේපල තක්සේරු කර බදු පදනම මත හෝ කුලී පදනම මත ගිවිසුම්ගත කරීමට කටයුතු කළ යුතුය. |
| **ii.** පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/13/2016(1) හා 2020 දෙසැම්බර් 03 දිනැති චක්‍රලේඛය අනුව මහා නගර සභාවකට අදාල ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් බදු දෙන අවස්ථාවකදී ඊට විෂයගත වන දේපළ මහා නගර සභා ආඥා පනතේ 35 හා 37 යන වගන්ති යටතට ගැනිය හැකි දේපළ වන විටදී ඒ සඳහා බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගේ/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සමඟ අතිගරු ජනාධිපතිතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. එහෙත් උක්ත දේපල දීර්ඝ කාලීන බදු පදනම යටතේ වසර 30 ක කාලසීමාවෙන් පසු බදුදීම සඳහා අදාළ අනුමැතීන් ලබාගෙන නොතිබුණි. | එම | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීමට විෂය භාර නිළධාරින් වගබලා ගත යුතුය. |
| **iii.** 2019 අගෝස්තු 11 දින බදුකුලී ගිවිසුමේ කාලය අවසන් වීමත් සමඟ නැවත බදුකුලී තක්සේරුවක් සිදුකළ යුතු වුවත් 2021 මාර්තු 17 දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ හේතුවෙන් රු.9,286,250 (වැට් සහිත) හිඟයක් ඇති වී තිබූ අතර එම හිඟ මුදල 2024 ජුනි 30 දින වන විටත් අයකර ගැනීමට වගකිව යුතු නිළධාරින් අසමත්ව තිබුණි. | එම | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීමට විෂය භාර නිළධාරින් වගබලා ගත යුතුය. |
| **(ග)** කොළඹ 05 රොබට් ගුණවර්ධන මාවතේ අංක 9/1 ස්ථානයේ මහ නගර සභාව සතු පර්චස් 14.76 ක් විශාල වූ ඉඩමක් පුද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබූ වසර 30 ක බදු කාලය 2017 දෙසැම්බර් 31 දින අවසන් වීමෙන් පසු 2018 පෙබරවාරි 27 දින කොමසාරිස් විසින් නැවත රු.2,000 ක මාසික කුලී මත වසර 10කට එම බදුකරුට මහා නගර සභා ආඥා පනතේ 40(1) (ඊ) වගන්තියේ විධිවිධානවලට පටහැනිව බදු පදනම මත ලබා දීමට තීරණය කර තිබුණි. පසුව නැවත මෙකී දේපල මාසික කුලිය රු.16,000ක් ලෙස තක්සේරු කර තිබූ නමුත් බදුකරු විසින් එකී කුලිය ගෙවා නොතිබුණු අතර ගිවිසුම් ගතවීමක් සිදු කර ගැනීමක් නොවීමෙන් 2018 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.1,008,000 ක පාඩුවක් සභාවට සිදුව තිබුණි. | එම | මහා නගර සභා ආඥා පනතට අනුව කටයුතු කළ යුතු අතර තක්සේරු කුලිය අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. කුලි අයකර ගැනීම පැහැරහැරීම සම්බන්ධව වගකිව යුතු නිළධාරින්ට එරෙහිව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ස)** සර් මාකස් ප්‍රනාන්දු මාවත අංක 45 දරන කොළඹ මහා නගර සභාවට අයත් අක්කර 4 රූඩ් 3 පර්චස් 31 ක් වූ ප්‍රසිද්ධ ක්‍රීඩා සංගමයක් පිහිටි ඉඩමේ වසර 30 ක බදු කාලය 2017 අගෝස්තු 01 දින අවසන්වී තිබුණි. බදු කාලය අවසන් වීමෙන් අනතුරුව සියලු ගොඩනැගිලි සමඟ නිරවුල් භුක්තිය මහා නගර සභාවට භාරදිය යුතු වුවත් එම සංගමයේ ඉල්ලීම මත බදුකාලය දීර්ඝ කිරීම, සභාව විසින් අනුමත කර තිබුණු නමුත් සංශෝධිත බදුකුලිය ගෙවීම හා ගිවිසුම්ගත වීම පැහැර හැර තිබුණි. හිඟ කුලිය අයකර ගැනීම, වසර තුනෙන් තුනට කුලිය සංශෝධනය කිරීම යන කොන්දේසි මත එම සංගමය ගිවිසුමකට නොඑළඹෙන්නේ නම් දේපළ පවරා ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් පැවතියද වගකිව යුතු නිළධාරින් ඒ සඳහා යොමු වී නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මහා නගර සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව නැවත බදුදීම සඳහා කටයුතු කළයුතු අතර බදුකරු අනවසරයෙන් රැඳීසිටීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| **(ච)** කොළඹ 13 ජම්පටා වීදියේ PPA 3233 හා Lot අංක 2 දරන මහා නගර සභාව සතු පර්චස් 14.20ක් වූ ඉඩම වාහන නවතා තැබීමේ ස්ථානයක් වශයෙන් පමණක් භාවිත කිරීමට කාන්තාවකට රු.5,000 ක මාසික කුලියකට 1986 පෙබරවාරි 26 දින කුලී ගිවිසුමකින් ලබා දී තිබුණි. ගිවිසුමේ 4 කොන්දේසිය උල්ලංඝනය කරමින් බදුකරු විසින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් එම දේපල මුද්‍රා තබා 2023 දෙසැම්බර් 31 දින වන විටත් පවරාගෙන නොතිබුණු අතර 1992 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා අයකර ගත යුතුව තිබූ හිඟ කුලිය රු.918,540 ක් ද වී තිබුණි. | එම | බිම් කොටස වහාම පවරාගෙන විධිමත් ලෙස ටෙන්ඩර් මඟින් බදුදිය යුතුය. රාජකාරී පැහැරහරින නිළධාරින්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ජ)** කොළඹ 12 ශ්‍රී සුමනතිස්ස මාවතේ වරිපනම් අංක 136 දරන පර්චස් 15.68 ක් විශාල වූ කොළඹ මහා නගර සභාව සතු ඉඩමක් දැව ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා අවිධිමත් ලෙස රු.30ක මාසික කුලියකට බදු දී තිබුණි. 1980 දෙසැම්බර් 11 දින ජාතික පුවත්පත්වල දැන්වීමක් පල කරමින් මෙම ඉඩම වසර 99 ට බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබූ අතර එවකට රු.3,250,000 ක ලංසුවක් පෞද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කළද එම ගනුදෙනුව සිදුකර නොතිබූ අතර මේ දක්වා අනවසර පදිංචිකරු ඉවත් කර ඉඩම බදු දීමට හෝ සාධාරණ කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම | 1980 වර්ෂයේ සිට අනවසරයෙන් පදිංචිව සිටින පුද්ගලයන්ගෙන් ඉඩමේ භුක්තිය ලබාගෙන ටෙන්ඩර් මඟින් බදුදීමට ක්‍රියාකල යුතුයි. |
| **(ට)** කොළඹ 5 උද්‍යාන වීදියේ හයිලෙවල් මාර්ගයට යාබදව පිහිටි කොළඹ මහා නගර සභාවට අයත් අක්කර 5 රූඩ් 2 පර්චස් 17ක විශාල වූ ඉඩමක් ක්‍රීඩා සමාජයක් වෙත බදු දී තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින අදාල බදු කාලය අවසන්ව තිබුණි. නැවතත් දීර්ඝ කාලීනව එම ක්‍රීඩා සමාජයටම බදු දීමට අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගෙන, වසර 3ක කාලයක් ඉක්මවා තිබුණද බදුකරුව රු.413,000ක් වූ නව මාසික තක්සේරු කුලිය ගෙවීමට එකඟ කර නොගෙන පැරණි බදු කුලී මුදලම අයකරමින් පැවතිණි. | එම | බදුකරු සමඟ ගිවිසුම්ගත වීමත්, හිඟ කුලිය අයකර ගැනීමත්, වසර තුනෙන් තුනට කුලී සංශෝධනය කිරීමත් කළ යුතුය. අනවසර භාවිතා කිරීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ය)** 2013 වර්ෂයට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ ආයෝජනයක් ලෙස රු.මිලියන 900 ක වියදමක් දරා ඉදිකර කොළඹ මහා නගර සභාවට භාරදෙන ලද ලොන්ඩ්‍රි කාමර 40 කින් යුත් නවම් මාවත ලොන්ඩ්‍රිය කොළඹ මහා නගර සභාව විසින් අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඊට පටහැනිව කිලිටු රෙදි කාමර හා රෙදි මදින කාමර 14 ක් පදිංචිය සඳහා භාවිතා කර තිබුණි. 2013 වර්ෂයේ අංක 1029 සභා තීරණය අනුව ලොන්ඩ්‍රිකරුවන්ගෙන් රු.50,000 ක තැම්පතුවක් ලබා ගැනීමටත්, රු.5,000 ක මාසික කුලියක් අයකර ගැනීමට ගිවිසුම්ගත වීමට නියමිත වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2017 වර්ෂයේ විශේෂ කොමසාරිස්ගේ තීරණයක් පරිදි රු.3,000 ක් දක්වා කුලී මුදල අඩුකර තිබුණි. ලොන්ඩ්‍රි 40 න් 14 ක් සම්පූර්ණයෙන්ම පදිංචිය සඳහා භාවිතා කරන අතර ලොන්ඩ්‍රි රැකියාවේ නියුතු නොවන පුද්ගලයින්ද මෙම ලොන්ඩ්‍රිවල පදිංචිව සිටින අතර අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ලොන්ඩ්‍රි පවත්වාගෙන යාමට ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | රජයේ ආයෝජන අවභාවිතාවීම වැළැක්වීම සඳහා අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| **(ඩ)** ලොන්ඩ්‍රි රැකියාවේ නියුතු පුද්ගලයින්ට ලබාදීම සඳහා රු.මි. 200 ක වියදමක් දරා 2012 වර්ෂයේ ඉදිකිරීම ආරම්භ කර 2016 වන විට ඉදිකිරීම් නිම කරන ලද නිවාස ඒකක 64 කින් සමන්විත වූ නිවාස සංකීර්ණය නිවාසලාභීන් වෙත භාර නොදීම හේතුවෙන් නිවාස සංකීර්ණයේ ජනෙල්, දොරවල්, නානකාමර සවිකිරීම්, වතුර මෝටර් විදුලි සවිකිරීම් සොරුන් විසින් ගලවාගෙන ගොස් තිබූ අතර නිවාසලාභීන් නොවන පවුල් අනවසරයෙන් පදිංචි වී තිබුණි. | එම | අනවසර පදිංචිකරුවන් ඉවත් කර නියමිත පුද්ගලයන් වෙත නිවාස ලබාදිය යුතු අතර සිදුවී ඇති අලාභයන් තක්සේරු කර වගකිව යුතු නිළධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඪ)** නගර සැලසුම් අංශයේ තාක්ෂණික නිළධාරින් සමඟ මරදාන සහ වැල්ලවත්ත ප්‍රදේශවල පරිශ්‍ර 16 ක ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ සිදුකළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී පරිශ්‍ර 5 ක අනුමත බලපත්‍ර රහිතව ද, පරිශ්‍ර 02 ක අනුමත බලපත්‍රයට පටහැනිව ද පරිශ්‍ර 2 ක බලපත්‍ර අළුත් කිරීමකින් තොරව ද ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පැවතිය ද නගර සැලසුම් අංශයේ නිළධාරින්ගේ අවධානය යොමු වී නොතිබුණි. ඉදිකිරීම් පරිශ්‍ර 07 කට අදාලව නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර තිබුණු බලපත්‍ර වල පිටපත් මහා නගර සභාව සතුව නොතිබුණි. | එම | අනවසරයෙන් සිදුකරන ඉදිකිරීම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** කොළඹ 07 ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මාවතේ අංක 15 දරන ස්ථානයේ නව ගොඩනැගිල්ලක් සඳහා වැසිජල සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා සිදුකරන ලද ඉල්ලීමකට අනුව ජලසම්පාදන හා ජලාපවහන අංශයේ අධ්‍යක්ෂවරයා විසින් 2020 ඔක්තොම්බර් 05 දින රු.මිලියන 90 ක ඇස්තමේන්තුවක් අදාල පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කර තිබුණි. එකී සමාගම විසින් නගරාධිපතිනිය වෙත 2021 ජනවාරි 11 දින ඉදිරිපත් කරන ලද ලිපියක් නගරාධිපතිනිය විසින් සෘජුවම ජලසම්පාදන හා ජලාපවහන අංශයේ | පිළිතුරු ලබාදී නොමැත. | කොළඹ මහා නගර සභාවේ වැසිජල පද්ධතියට හා අපජල පද්ධතියට සම්බන්ධතා ලබාදීමේදී සම්බන්ධතාවේ ස්වභාවය අනුව කොන්ත්‍රාත් මුදල තීරණය කරන බැවින් |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂවරයාට යොමුකර තිබු අතර ඒ අනුව රු.මි 90 ක ඇස්තමේන්තුව වෙනුවට රු.මිලියන 3.08 ක නව ඇස්තමේන්තුවක් අනුමත කර ඒ අනුව අදාල වැසිජල සම්බන්ධතාවය ලබාදී තිබුණි. මුලින් රු.මිලියන 90 ක් වූ ඇස්තමේන්තුව රු.මිලියන 3.08 ක් දක්වා අඩු කිරීමට හේතු වූ කරුණ ලෙස අදාල ස්ථානයේ සිට නොරිස් ඇල දක්වා වෙනම නල මාර්ගයක් දැමීමට මුලින් අදහස් කළ බවට වාර්තා කළ ද නගර සභාව සතුව එවැනි යෝජනාවක් හෝ සැලැස්මක් නොතිබූ හෙයින් ද ලිප්ටන් වටරවුම ප්‍රදේශය ගංවතුර තර්ජනයක් පවතින ප්‍රදේශයක් නොවන බැවින්ද රු.මිලියන 90 ක ඇස්තුමේන්තුවක් ලබා දීම මතභේදයට තුඩු දෙන කරුණක් විය. | | විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. |
| **(ආ)** | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන මගින් හෝ දරිද්‍රතා ආඥා පනත මඟින් නීතිමය විධිවිධාන සලසා නොමැති කරුණක් වූ රටේ පවත්නා ආර්ථික උද්ධමනය හේතුවෙන් ආර්ථික අපහසුතාවයට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීම යන කරුණ සඳහා රු.459,620,000 ක මුදලකට රු.3,500 බැගින් වූ තිළිණපත් 134,000ක් ලක් සතොස වෙතින් මිලදී ගෙන කිසිදු නිර්නායකයක් රහිතව එක් එක් නගර සභිකයින්ගේ අභිමතය පරිදි බෙදාහැර තිබුණු අතර එම වියදම මහා නගර සභා ආඥාපනතේ 188(1) වගන්තිය යටතේ ඉඩදී නොමැති වියදමක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | මහා නගර සභා ආඥා පනත 188 වගන්තිය යටතේ ඉඩදී ඇති වියදම් සඳහා පමණක් සහා අරමුදල් භාවිතා කල යුතුය. |
| **(ඇ)** | පෞද්ගලික රෝහලක් වෙත බදු දී තිබු සර් ජේම්ස් පීරිස් මාවතේ පිහිටි වරිපනම් අංක 71 ½, 71 1/3,73 යන වරිපනම් අංක දරන කොළඹ මහ නගර සභාවට අයත් රූඩ් 01 පර්චස් 0.1ක ප්‍රමාණයෙන් යුත් ඉඩමේ වසර 30ක බදු කාලය, මහ සභාවේ අනුමැතිය අනුව 1992 ඔක්තෝබර් 22 දින සිට වසර 50ක් දක්වා දීර්ඝ කිරීමෙන් පසු 2004 නොවැම්බර් 30 දින අංක 3411 දරන නව බදු ගිවිසුම අත්සන් කර තිබුණි. එකී ගිවිසුමේ 2 හා 3 කොන්දේසි අනුව නාගරික තක්සේරුකරු විසින් වර්ෂයකට බිම් කුලිය රු.මිලියන 5 ක් හා මාසික නාමික කුලිය රු.18,000 ක් ලෙස 2022 දෙසැම්බර් 22 දින තක්සේරු කර තිබුණි. බදු කුලිය සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව මුදල් කමිටුව 2023 පෙබරවාරි 17 වැනි දින හා මහා සභාව 2023 මාර්තු 3 දින අනුමත කර තිබුණ ද තක්සේරු වාර්තාව අනුව ඉදිරි වසර 20 ක් සඳහා එකවර අයකළ යුතුව තිබූ බිම් කුලිය වන රු.මිලියන 100 ක් වෙනුවට රු.මිලියන 5ක බිම් කුලියක් අයකර ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම තුලින් හා එකී මිලියන 5ක මුදලද අයකර නොගැනීම තුලින් මහ නගර සභා අරමුදලට රු.මිලියන 100ක මුදලක් අහිමිකර තිබුණි. | එම | තක්සේරු බිම් කුලිය බදුකරුගෙන් අයකර නොගන්නේ නම් මහා නගර සභා අරමුදලට සිදුව ඇති පාඩුව වගකිව යුතු නිළධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | ආර්නෝල්ඩ් රත්නායක මාවත මහල් නිවාස සංකීර්ණයේ පදිංචිකරුවන් සඳහා නිවාස සංවර්ධන අධිකාරියෙන් නිවාස 65 ක් ලබාගෙන තිබුණද එකී නිවාස වලින් නිවාස 14 ක් නගරාධිපති කාර්යාලයේ සහ නාගරික ලේකම් | නිත්‍යානුකූල පදිංචිය ලබාදීමේ අගතියක් නොවන ආකාරයට කටයුතු කිරීමට අදාල අංශභාර නිළධාරින්ට | නාගරික දේපළ අවභාවිතාවීම වලක්වමින් සේවකයන් වෙත ලබාදෙන ලද නිවාස නිල නිවාස සේ |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ සේවයේ නියතු සේවකයින් වෙත අවිධිමත් ආකාරයට ලබාදී තිබුණි. | උපදෙස් ලබාදී ඇති බව හා ඒ අනුව තාවකාලික පදිංචිය සඳහා සේවකයන් සමඟ ගිවිසුම් අත්සන් කිරිමට යෝජිතව පවතින බව. | සලකා ගිවිසුම්ගත වීම හා කුලී අයකිරීම් කළ යුතුය. |
| (ඉ) | අංක 20 මැගසින් පාර අංක 20හි පිහිටි පර්චස් 17.7 ක විශාලත්වයකින් යුත් ඉඩම "මැගසින් බෞද්ධ පුස්තකාල සංගමය" නම් සංගමයකට 1983 සැප්තැම්බර් 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක 90 දරන ගිවිසුම මඟින් ටෙන්ඩර් ක්‍රියාවලියකින් තොරව මසකට රු.150 ක කුලියට එක් වර්ෂයක් සඳහා බදු දී තිබුණි. එකී කුලී ගිවිසුම නැවත අළුත්කර නොතිබුණු අතර එවැනි ලියාපදිංචි සංගමයක් ද නොතිබියදී එම සංගමය නමින් බදු අයිතිය සංශෝධනය කරදෙන ලෙස එම සංගමයේ සභාපති ලෙස කටයුතු කළ පුද්ගලයා විසින් 2020 මාර්තු 12 දිනැතිව ඉල්ලීමක් කර තිබූ අතර 2014 නොවැම්බර් 23 දිනැතිව ලබාදී ඇති සහතිකයක් අනුව නගර සභා මුරකරුවකු පදිංචිව සිටින බව සහතික කර තිබුණි. ඒ අනුව නගර සභාවේ සේවයේ නියුතු වෙමින්, නගර සභා දේපලෙහි අනවසරයෙන් පදිංචිව සිටිමින් හා ව්‍යාපාර කටයුතු පවත්වා ගනිමින් සිටින විටත් නගර සභා බලධාරීන් විසින් එම පුද්ගලයාට එරෙහිව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වහාම ඉඩමේ භුක්තිය පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ටෙන්ඩර් ක්‍රමය භාවිතා කර ඉඩම හා ගොඩනැගිලි බදුදීම හෝ කුලියට දීම සිදුකළ යුතු අතර නගර සභා සේවකයාට එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ගයක් ගත යුතුය.. |
| (ඊ) | කොළඹ 14 මහකුමාරගේ මාවතේ අංක 3 දරන ස්ථානයේ පර්චස් 6.80ක් විශාල වූ ඉඩමක් 2020 ජනවාරි 14 දින අවුරුදු 30 කට පුද්ගලයෙකුට රු. 60,000කට බදු දී තිබුණි. 2020 ජනවාරි 14 දින බදු කාලය අවසන් වීමෙන් පසුව දේපල නැවත පවරා නොගෙන රු.83,000ක මාසික කුලියකට වසර 3ක කාලයක් සඳහා බදුකරුටම බදු දී එකී කාලයද අවසන්ව තිබූ අතර ගණකාධිකාරී ආදායම්ගේ ඉල්ලීම අනුව නාගරික තක්සේරුකරු විසින් මෙම දේපලේ බදු කුලිය රු.138,060ක් ලෙස නැවත තක්සේරු කර එම පුද්ගලයාටම නැවත වසර 20ක් සඳහා බදු දීමට අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියකින් තොරව තීරණය කර තිබුණි. | එම | අවධිමත් ලෙස බදුදීම වහාම නතර කර විධිමත් ලෙස බදුදීමට කටයුතු කළ යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවේ මැදහත්වීමකින් තොරව නාගලගම්වීදිය පොදු වෙළඳපොල ඉදිරිපිට පිහිටි මහා නගර සභාවට අයත් රූඩ් 03 පර්චස්2.12 ක් විශාල වූ ඉඩම බාහිර පාර්ශ්වයන් වෙනුවෙන් පුද්ගල කණ්ඩායමක් විසින් වාහන ගාල් කිරීම සඳහා ගාස්තු අය කිරීමට ටිකට්පතක් නිකුත් කර ආදායම් ඉපයීමක් සිදු කිරීම සම්බන්ධයෙන් මහා නගර සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | නගර සභාවට ආදායමක් ලැබෙන පරිදි විධිමත් ලෙස නිත්‍යානුකූලව ඉඩම බදුදීමට කටයුතු කළ යුතුයි. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ මහා නගර සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 8700ක් වන අතර 2023 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 5317 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 3518 ක් විය. එසේම විධායක ශ්‍රේණිවල 29 දෙනෙකු හා ද්විතීය ශ්‍රේණියේ 106 දෙනෙකුගෙන් සමන්විත අතිරික්ත සේවක සංඛ්‍යාවක් විය. පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ. | | |
| i. | මහා නගර සභාවේ සේවා අවශ්‍යතා පිළිබඳ අධ්‍යනයක් කර සේවක සමාලෝචනයක් මඟින් කාර්ය මණ්ඩල සංශෝධනයක් කළ යුතු වුවත් දීර්ඝ කාලයකින් එවැනි සමාලෝචනයක් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කොළඹ මහා නගර සභාවේ සේවක අවශ්‍යතාවයන් අධ්‍යනය කර සේවක සමාලෝචනයක් සිදුකළ යුතුය. |
| ii. | මහා නගර සභාවේ විධායක ශ්‍රේණියේ සිට සුළු සේවකයින් දක්වා වූ තනතුරු වල පුරප්පාඩු පදනම් කරගෙන “ශ්‍රම මිලදී ගැනීමේ පදනම” මත යැයි සඳහන් ක්‍රමයක් මත දෛනික වැටුප් ගෙවීමේ ක්‍රමයකට නිලධාරීන් හා සේවකයින් 409 දෙනෙකු 2023 ජුනි 30 දිනවන විට සේවයේ නියුක්ත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා එවැනි නිලධාරීන් හා සේවකයින් සඳහා ගෙවන ලද වැටුප රු.219,066,660 ක් විය. | එම | අවිධිමත් බඳවා ගැනීම් වළක්වාලමින් විධිමත් පරිදි පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | වැල්ලවත්ත පොදු වෙළඳපොලේ හතරවන මහලේ කාමරයක ගබඩා කර තිබූ රු.327,030ක් වටිනා පුවත්පත් සහ සඟරා තොගයක් සොරකම් කිරීම සම්බන්ධව ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේදී වරද පිළිගත් එම පොදු වෙළඳපොලේ සේවයේ නියුතු කම්කරුවකු විසින් වටිනාකම මහා නගර සභාවට ගෙවීම හේතුවෙන් මාස 06 ක බරපතල වැඩ සහිත සිර දඬුවම් නියමකර වසර 5 කට අත්හිටුවා තිබුණද එකී කම්කරුවාට හා වැල්ලවත්ත පොදු වෙළඳපොලේ සේවයේ නියුතු වෙළඳසැල් පරිපාලකවරු දෙදෙනා හා කම්කරුවන් පස් දෙනාට එරෙහිව විධිමත් පරීක්ෂණයක් සිදුකර විනයානුකූලව කටයුතු කර නොතිබුණි. | එම | වරදකරු වූ සේවකයා සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන කොමසාරිස් විසින් 2020 අගෝස්තු 27 දිනැති අංක LCD/09/2019(1) දරණ පළාත් ආයතන වල ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛය මඟින් උපලේඛනගත කර තිබූ ආකෘති පත්‍ර ප්‍රකාරව මහා සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික අයවැය | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ උපදෙස් පරිදි අයවැය සකස් කර මහ සභාවට ඉදිරිපත් කළ යුතුය. |

ලේඛනය තුළ ඉදිරිපත් කළ යුතු ලේඛන 2023 වර්ෂයේ අයවැය ලේඛනය සමඟ පිළියෙළ කර ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික අයවැය ලේඛනය, ගිණුම් ප්‍රමිතියට සමගාමීව මෙම චක්‍රලේඛය මඟින් නියම කර ඇති කේත අංක හා ආකෘති පත්‍ර භාවිතා කරමින් ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2023 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 33 ක් නිකුත් කර තිබූ අතර ඉන් වාර්තා 13 ක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි. අභ්‍යන්තර විගණක ලබා දුන් නිර්දේශ 33 කින් නිර්දේශ 02 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අභ්‍යන්තර විගණක නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |